# උත්ථාන සමයේ සයවන සතිය
# අඟහරුවාදා

## පළමුවන කියැවීම

අපෝස්තුළුවරුන්ගේ ක්‍රියා පොතෙන් ගත් පාඨයෙකි.

ක්‍රියා 16:22-34

**"ක්‍රිස්තුස් වහන්සේ කෙරෙහි විශ්වාස කරන්න. එවිට ඔබ ගැළවෙන්නෙහි ය."**

ජනයා පාවුලු සහ සීලස්ට විරුද්ධව එක්ව නැඟී සිටියහ. නඩුකාරයෝ ද ඔවුන්ගේ වස්ත්‍ර ඉරා දමා, කෝටුවලින් ඔවුන්ට තළන්නට අණ කළෝය. ඔවුන්ට බොහෝ පහර දුන් පසු, හිරගෙයි දමා ඔවුන් පරෙස්සමෙන් රැකබලා ගන්නා ලෙස සිරගෙයි මුලාදෑනියාට අණ කළහ. මෙසේ අණ ලැබූ ඔහු, ඔවුන් ඇතුළු සිර කාමරයේ දමා, ඔවුන්ගේ පාද දඬු කඳන්වල සවි කළේය.

එහෙත් මධ්‍යම රාත්‍රිය පමණේදී, පාවුලු ද සීලස් ද යාච්ඤා කරමින් දෙවියන් වහන්සේට ගී ගැයූහ. හිරකාරයෝ ද ඔවුන්ට ඇහුම්කන් දීගෙන සිටියහ. හදිසියෙන් මහත් පොළෝ කම්පාවක් විය. සිරගෙයි අත්තිවාරම් සෙලවිණ. එකෙණෙහිම සියලු දොරවල් ඇරිණි. සියල්ලන්ගේ බැඳුම් ද ලිහිණි. එකල හිරගෙයි මුලැදෑනියා නින්දෙන් අවදිව, හිරගෙයි දොරවල් ඇරී තිබෙන බව දැක, හිරකරුවන් පැන ගියහ යි සිතා, කඩුව අතට ගෙන සිය පණ හානි කරගන්නට සැරසුණේය. එහෙත් පාවුලු කතා කරමින් "ඔබට කිසි අනතුරක් කර නොගන්න. අපි සියල්ලෝම මෙහිය" යි මහත්

හඬින් මොර ගසා කීය. එකල ඔහු පහනක් ඉල්ලා ගෙන ඇතුළට පැන භයින් වෙවුලමින්, පාවුලු සහ සීලස් ඉදිරියෙහි වැටී, ඔවුන් පිටතට කැඳවා "ගැලවීම ලබන පිණිස මා කුමක් කළ යුතුද?" යි ඇසී ය. ඔව්හු පිළිතුරු දෙමින් "ස්වාමින් වන ජේසුස් ක්‍රිස්තුස් වහන්සේ අදහා ගන්න. එවිට ඔබ ගැලවෙන්නෙහිය. ඔබ ද ඔබේ ගෙයි වැසියෝ ද ගැලවෙන්නාහ" යි කීවෝය.

තවද ඔව්හු ඒ මුලාදැනියාට ද ඔහුගේ ගෙදර වැඩි සියල්ලන්ට ද ස්වාමින් වහන්සේගේ වචනය පහදා දුන්හ. මුලාදැනියා රාත්‍රියේ ඒ පැයේදීම ඔවුන් රැගෙන ඔවුන්ගේ තුවාල සේදුවේය. ඔහු ද ඔහුගේ ගෙයි වැසි සියල්ලෝද එවේලේම බෞතීස්ම ස්නාපනය ලැබූහ. ඔහු තමාගේ ගෙට ඔවුන් කැඳවා ගෙන ගොස්, කෑමෙන් සංග්‍රහ කොට තමා දෙවියන් වහන්සේ අදහා ගත් බැවින් සිය ගෙයි වැසි සියල්ලන් සමඟ අතිශයින් ප්‍රීති විය.

දේව වාක්‍යය එසේය.

## පිළිතුරු ගීය

ගීතාවලිය 138: 1-3, 7-8

පිළිතුර: අහෝ සමිඳුනි, ඔබේ සුරතින් ඔබ මා ගළවන සේක.

ගීය:

සමිඳුනි හද පත්ලෙන් ඔබට තුති කරන්නෙමි. දෙව්වරුන් ඉදිරියෙහි ඔබට ගී ගයා ඔබ පසසන්නෙමි.
ඔබේ ශුද්ධ මාලිගාව දෙස බලා නමස්කාර කරමින් ඔබේ කරුණා ගුණය සහ සත් ගුණය නිසා ඔබේ නාමයට තුති පුදන්නෙමි.

ඔබේ නාමයත්, ආඥාත් මාගේ උත්තරීතර බව ඔබ පෙන්වූ සේක.
මා ඔබ යැදි දවසේ දී ඔබ මට පිළිතුරු දුන් සේක.
මාගේ සිත සවි කොට මට ධෛර්යය දුන් සේක.
මම විපත්ති මැද හැසිරෙමි. නමුත් ඔබ මා රැකබලා ගන්නා සේක.

ඔබ මාගේ සතුරන්ගේ අදහසට විරුද්ධව ඔබේ හස්තය දිගු කරන සේක.
ඔබේ සූරතින් ඔබ මා ගළවන සේක.
සමිඳාණෝ මා සම්බන්ධව අදහස් කරන දේ ඉටු කරන සේක.
සමිඳුනි ඔබේ ප්‍රේමය සදා පවත්නේය.
ඔබ ඇරඹූ දේ නිම කළ මැනව.

## සාධුකාරය

ආලේලූයා! ආලේලූයා!
"සත්‍යතාවයේ ආත්මයාණන් වහන්සේ පැමිණි කල
උන්වහන්සේ සම්පූර්ණ සත්‍යය කරා යැමට ඔබට මඟ පෙන්වන සේක."
ආලේලූයා!

# සුවිශේෂය

සුවිශේෂක ජුවාමිතුමන් විසින් ලියන ලද දේව වාක්‍යය නම් මෙසේය.

ජුවාම් 16: 5–11

## "මා නික්ම නොයන්නෙම් නම් සැනසිලිදායකයාණෝ නොවඩින්නාහ."

"එහෙත් දැන් මා එවා වදාළ තැනැන්වහන්සේ වෙතට යමි. එසේ වුවද, 'ඔබ කොයි යන්නේදැ' යි ඔබ අතරෙන් කිසිවෙක් මගෙන් නොඅසති. එනමුත් මා මේ දේවල් ඔබට කී බැවින්. ඔබේ සිත් දුකින් පිරී ඇත. කෙසේ වෙතත්, මම ඔබ හට සැබෑව පවසමි. මාගේ නික්මයාම ඔබේ ශුභ සිද්ධිය පිණිස ය. මා නික්ම නොගියොත් සහායදායකයාණන් වහන්සේ ඔබ වෙත වැඩම නොකරන සේක. එහෙත් මම යන්නෙම් නම්, උන්වහන්සේ ඔබ වෙත එවන්නෙමි.

උන්වහන්සේ පැමිණි කල පාපය ගැන ද ධර්මිෂ්ඨකම ගැන ද විනිශ්චය ගැන ද ලෝකයාට වටහා දෙන සේක. පාපය ගැන යයි කීවේ ඔවුන් මා නොඅදහන බැවිනි. ධර්මිෂ්ඨකම ගැන යයි කීවේ මින්පසු ඔබ මා නොදකින සේ මා පියාණන් වහන්සේ වෙතට යන බැවිනි. විනිශ්චය ගැන යයි කීවේ මේ ලෝකයේ අධිපතියා විනිශ්චය කරන ලද බැවිනි.

සුවිශේෂ වාක්‍යය එසේය.